## නව විදුලි සේවා සැපයුමක් ලබා ගැනීම සඳහා උපදෙස්

1. යම් පරිශ්‍රයක අයිතිකරුට, පදිංචිකරුට හෝ ව්‍යාපාරයක්/ කර්මාන්තයක් සිදු කරගෙන යන පිරිසකට එම පරිශ්‍රය සඳහා නව විදුලි සේවා සැපයුමක් ලබා ගැනීමට ඉල්ලුම් කල හැක.

2. අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා ජාතික හැඳුනුම්පත සහ එහි පිටපතක් ඉදිරිපත් කල යුතුය.

   එසේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල නොහැකි නම් ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රය ඡායා පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය.

3. අයිතිය, පදිංචිය හෝ ව්‍යාපාරයක් / කර්මාන්තයක් සිදු කරගෙන යන බවට තහවුරු කිරීම සඳහා පහත සඳහන් ඕනෑම ලියවිල්ලකින් එකක් හෝ ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් බව සැලකිය යුතුයි.

   3.1 ඉල්ලුම්කරු නීත්‍යානුකූල හිමිකරු නම් හිමිකම් ඔප්පුව.

   3.2 අදාල ස්ථානය සඳහා බදු/කුලී ඔප්පුව/ගිවිසුම.

   3.3 අයදුම්කරුගේ නමට ලබා දී ඇති අනුකූලතා සහතිකය.

   3.4 අදාල ස්ථානයේ වරිපනම් නිවේදනය.

   3.5 විදුලි සේවා සැපයුම ඉල්ලුම් කරන පරිශ්‍රයේ ලිපිනය සඳහන් ජාතික හැඳුනුම්පත.

   3.6 අයදුම්කරුගේ නම හා ලිපිනය සඳහන් අදාල ස්ථානයේ වෙනත් උපයෝගීතා සේවාවක් සඳහා ලැබුණු මාස 03 නොඉක්ම වූ බිල්පතක් (දුරකථන, ජල බිල්පත් යනාදිය).

   3.7 ඉහත ස්ථානයේ නීත්‍යානුකූල පදිංචිකරු හෝ අයිතිකරු හෝ ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන් බවට ග්‍රාම නිලධාරි සහතිකය.

   3.8 අදාල ස්ථානයේ අයිතිය, පදිංචිය හෝ ව්‍යාපාරයක් / කර්මාන්තයක් සිදු කරන බවට තහවුරු වන වෙනත් ඕනෑම ලියවිල්ලක්.

4. විදුලිය ලබාදීමට පෙර අභ්‍යන්තර තතැඳුම් සම්මත ඉංජිනේරු ප්‍රමිතීන්ට අනුව නිම කළ යුතුය. ලංකා විදුලි බල මණ්ඩලය විසින් අභ්‍යන්තර විදුලි තතැඳුම් ප්‍රමිතීන්ට අනුකූල නම් පමණක් විදුලි සැපයුම ලබාදෙනු ඇත.

5. අන්සතු අයගේ ඉඩම් උඩින් ඔබට විදුලිය සපයන සේවා රැහැන් ඇදීමට ඇත්නම්, ඒ සඳහා එම ඉඩම් හිමිකරුවන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට මේ සමඟ අමුණා ඇති මාර්ග අවසර පත්‍රය (ඇමුණුම 3 ) එම එක් එක් ඉඩම් හිමිකරුවන් විසින් වෙන වෙනම සම්පූර්ණ කර අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුය. (එම පෝරමයෙහි අමතර පිටපත් අවශ්‍ය නම් ඡායා පිටපත් ලබා ගෙන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.)

6. තෙකලා තතැඳුම් සඳහා සහ ආරක්ෂිත හේතුන් මත ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනුවත් කරනු ලබන එකලා සැපයුම් සඳහා ද ලංකා විදුලිබල මණ්ඩලයේ අදාල වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති වරලත් විදුලි ඉංජිනේරුවරයෙකු විසින් පරීක්ෂා කර නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තාවක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි වරලත් විදුලි ඉංජිනේරුවරුන්ගේ නාම ලේඛනය අදාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙන් හෝ ප්‍රධාන / ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

7. මාසිකව මණු කියවීමේදී ඔබගේත් විදුලිබල මණ්ඩල සේවකයන්ගේත් පහසුව සඳහා, මණුව තාප්පයේ හෝ ගේට්ටුව අසල සවිකිරීම දිරිමත් කරන අතර ඒ සඳහා අදාළ දල සටහනක් ඇමුණුම 4 හි දක්වා ඇත.

8. විදුලි මනු කියවීම සඳහා පහසුවෙන් ලඟාවිය හැකි ජලය කාන්දු වීමෙන් හෝ වැස්සෙන් නොතෙමෙන ලෙස පොලව මට්ටමේ සිට මීටර් 1 1/2 ක් ඉහළින් විදුලි මනුව සවිකිරීමේ ස්ථානය සකස් කර බැරතත මීටර් 1 ක පමණ ප්‍රමාණයක් මනුවට ඇමුණුම් කටයුතු සඳහා ඉතිරි කර තැබිය යුතුය.

9. සේවා රැහැන් පොළව මට්ටමේ සිට මීටර් 3.7 කට වඩා උසින් සිටින සේ සවි කිරීම සඳහා "L" යකඩයක් සවිකර තිබීමට කටයුතු කළ යුතුය (ඇමුණුම 5.). එසේ කිරීමට නොහැකි ස්ථානයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිර්දේශිත වෙනත් ආරක්ෂිත ක්‍රමයක් සේවා වයරය සවි කිරීම සඳහා අවශ්‍ය ආකාරයට සවිකර තිබිය යුතුය (ඇමුණුම 6.).

10. විදුලි සේවා රැහැන් ඇදීමට යෝජිත මාර්ගයෙහි ඇති ඉඩම්වල ගස් අතු කපා හෙළි පෙහෙළි කිරීම විදුලිය ඉල්ලුම්කරු සතු කාර්යයක් වන අතර, ඉදිරි කාලයේදීද එසේ අදිනු ලබන සේවා රැහැන් වලට ගස්, අතු අවහිර නොවන සේ පවත්වා ගැනීම ගිවිසුම් ගත පාරිභෝගිකයාගේ වගකීමක් වනු ඇත. යම් හෙයකින් එසේ අවහිර වන ගස්, අතු ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉවත් කරනු ලැබුවහොත්, ඒ සඳහා වන පිරිවැය පාරිභෝගිකයා විසින් දැරිය යුතුය.

11. ලංකා විදුලිබල මණ්ඩලය විසින් දන්වන පරිදි විදුලි සැපයුම වෙනුවෙන් ආරක්ෂිත ඇප තැන්පතු මුදලක් තැන්පත් කළ යුතුය. මුදල් ගෙවීමෙන් අනතුරුව ඔබ වෙත ලබාදෙන ගෙවීම් වවුචරයේ මුල් පිටපත සුරක්ෂිතව තබා ගන්නා ලෙස ඔබ වෙත අවධාරණය කරනු ලැබේ. මෙම ඇප තැන්පත් මුදල සේවා සැපයුම අවසන් කිරීමේදී හෝ වෙනත් අයෙකුට පැවරීමේදී, ලංකා විදුලිබල මණ්ඩලය වෙත අයවිය යුතු යම්කිසි මුදලක් ඇතොත් එම මුදල අදාල ඇප තැන්පත් මුදලින් අඩු කර ඉතිරි මුදල ආපසු ගෙවනු ලැබේ.

12. සේවා සැපයුම සඳහා ඇස්තමේන්තු මුදල සහ ආරක්ෂිත ඇප තැන්පතුව ගෙවීම් කිරීමෙන් පසුව කිසිදු වෙනත් ගෙවීමක් පාරිභෝගිකයෙකු විසින් ගෙවිය යුතු නොවේ. මෙම සේවාව ලබා දීම සඳහා අවශ්‍ය වන සියළුම අමුද්‍රව්‍ය සහ ශ්‍රමය ලංකා විදුලි බල මණ්ඩලය විසින් දරණු ලබන බවට ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

13. ඇස්තමේන්තු මුදල සහ ආරක්ෂිත ඇප තැන්පතු මුදල ගෙවීමෙන් පසු සංශෝධිත ගෙවීමක් වේ නම් ඒ සම්බන්ධයෙන් ලිඛිත දැනුම් දීමක් අදාල ප්‍රධාන හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු විසින් පමණක් සිදු කරනු ඇත.